**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2018**
**-----------------------------------------------------------------------------------**

**1.1 මතය**
**-------**

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
-------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසය සඳහා ගෙවා තිබූ රු.199,410 ක වාහන බද්දු කුලී වාරිකය, විදුලි සංදේශ වියදම් ගිණුම හර කිරීම නිසා වාහන කුලී වාරික ගිණුම එම වටිනාකම අඩුවෙන්ද විදුලි සංදේශ වියදම වැඩියෙන්ද ගිණුම් ගතවී තිබුණි. | නොවැම්බර් මාසය සඳහා ගෙවූ වාහන බදු කුලී ගිණුම් ගත කිරීමේදි අත්වැරදීමකින් එය තැපැල් හා විදුලි සංදේශ වියදම් ගිණුමට ගලපා ඇත. ඉදිරියේදි මෙවැනි අත්වැරදීම් සිදුවීම වැළැක්වීමට කටයුතු කරනු ලැබේ. | වියදම් විෂයයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 ලැබියයුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාඨමාලා ගාස්තු එක් එක් පාඨමාලාවේ අවසන් විභාග පරීක්ෂණයට කලින් අයකර ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ පාඨමාලා 07 කට අදාළව ලැබිය යුතු පාඨමාලා ගාස්තු ලෙස දක්වා තිබූ රු.39,665,822 ක මුදල තුළ පාඨමාලා අවසන් වී වසර 01 - 03 දක්වා කාල පරාසයක පැවති වටිනාකම රු.19,984,027 ක් වී තිබුණි. | පාඨමාලාවන්වල අවසන් කළයුතු අවම කාලය පමණක් අවසන් වී වසර 01 - 03 දක්වා කාලයක් ඉක්ම ගොස් ඇති අතර එම පාඨමාලවන්හි සක්‍රිය කාලය හෙවත් අදාළ පාඨමාලාව අවසන් කිරීමට ඇති උපරිම කාලය තවමත් අවසන් වී නොමැත. ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාවන් තම පාඨමාලාවන්හි උපරිම කාලය තුළ අවසන් කරන අවස්ථාවලදී එම සිසුන්ගේ ගාස්තු සම්පූර්ණ වශයෙන් ගෙවනු ඇත. | ලැබිය යුතු ආදායම් අදාළ කාලපරිච්ඡේදය තුළ නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි අංක 1646 | සෑම මාසයකම දෛනික ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථමයෙන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අංක WPNC - 9019 දරන වාහනයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපි අංක 02/2010 මගින් අන්තර්ග්‍රහනය කළ 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියලුම නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සිදු කළ යුතු වුවත්, පැමිණීමේ ලේඛනය මගින් පමණක් පැමිණීම හා පිටවීම සටහන් කර තිබුණි. | මේ වන විට ආයතනයට පැමිණීම පිටවීම සටහන් කිරීම සඳහා අඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර හඳුන්වාදීමට සියලු කටයුතු සිදු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2016 අංක 30 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | ආයතනය සතු WPNC - 9019 දරන කල් බදු ක්‍රමයට ලබා ගත් වාහනය චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂා කර ධාවන සටහන් සම්පූර්ණ කර නොතිබුණි. | 2018 ඔක්තෝම්බර් මස 10 වැනි දින වාහනයේ දැවෙන ඉන්ධන පරීක්ෂාව සිදුකළ අතර දෛනික ධාවන සටහන් තුලනය කිරීම ආරම්භ කරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.31,978,203 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.22,108,617 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,869,586 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වැඩිවීමට පුනරාවර්තන ප්‍රදාන රු.4,800,000 කින් හා අභ්‍යන්තර ආදායම් ඉපැයීම රු.14,005,572 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 02 ක මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී වර්ෂ 03 හිම මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් ගැළපීමෙන් පසු 2016 වර්ෂයේ 45,666,590 ක් වූ ආයතනික දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2018 වර්ෂයේ රු.79,111,897 ක් වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 අනාර්ථික ගනුදෙනු
----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පර්යේෂණ ප්‍රදානයක් වශයෙන් ස්විස්ටර්ලන්තයේ Foundation Open Society Institute (FOSI) මගින් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙනුවෙන් භාණ්ඩාගාරය වෙත 2018 ජනවාරි 18 දින ලැබී ඇති ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 24633 ක මුදල (රු.3,824,679) විගණන දිනය වූ 2019 මාර්තු 07 දින වන විටත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා ආයතනික අරමුදලින් රු.2,164,103 ක මුදලක් වැය කර තිබුණි. | ස්විස්ටර්ලන්තයේ Foundation Open Society Institute (FOSI) මගින් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙනුවෙන් භාණ්ඩාගාරය වෙත එවූ මුදල් භාණ්ඩාගාරයෙන් නිදහස් කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු දීර්ඝ ක්‍රියාවලිය හේතුවෙන් අදාළ මුදල් නිදහස් කර ගැනීම ප්‍රමාද විය. ව්‍යාපෘතියේ කටයුතු 2018 වසර තුළ ආරම්භ කළ යුතු වූ බැවින් සහ භාණ්ඩාගාරය වෙත අදාළ මුදල් ලැබී තිබුණු බැවින් ආයතනයේ මුදල් තවකාලිකව යොදවා ව්‍යාපෘති කටයුතු ආරම්භ කරන ලදී. | අරමුදල් කඩිනමින් ලබාගැනීමට කටයුතු කළ යුතු අතර, ආයතනික අරමුදල් නිසි පරිදි කළමනාකරණය කර උපයෝජනය කළ යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනය මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වෑන් රථය සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ මාසික කල්බදු කුලිය රු.2,392,920 ක්, ඉන්ධන වියදම රු.218,092 ක්, රියදුරුගේ වැටුප රු.630,202 ක් හා අතිකාල දීමනා රු.128,059 ක් වශයෙන් මුළු වියදම රු.3,374,273 ක් වූයෙන් එහි ධාවන කිලෝමීටරයකට සාමාන්‍ය වියදම රු. 217 තරම් වූ අධික වියදමක් විය. | මෙම ආයතනය වෙනුවෙන්ම වෑන් රථයක් මිලදී ගැනීමට මුදල් අමාත්‍යාංශයෙන් ලිඛිතව ඉල්ලීම් සිදුකරනු ලැබුවද, එහිදී මුදල් අමාත්‍යාංශය මගින් ප්‍රකාශ කරනු ලැබුවේ එම අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ වලට අනුකූලව වෑන් රථයක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගන්නා ලෙසයි. මේ හේතුවෙන් විකල්ප ක්‍රමයක් භාවිතයට ගැනීමට ආයතනයට නොහැකි විය. තවද විකල්ප ක්‍රමයක් භාවිතයට ගැනීම විවිධ හේතු නිසා ආයතනයට ප්‍රායෝගික නොවීය. | ආයතනික අවශ්‍යතාවයට ප්‍රමාණවත් වන පරිදි වාහන පහසුකම් සලසා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 ජනවාරි 03 දිනැති අංක 1843/45 දරන ගැසට් පත්‍රය යටතේ ආරම්භ කර තිබූ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලියේ 6(අ) වගන්තිය අනුව විශ්වවිද්‍යාලයේ නිර්දේශ මත කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිව මානව හා සමාජ විද්‍යා ක්ෂේත්‍ර වෙත පිරිනැමිය යුතු පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා සහතික පත්‍ර පිරිනැමිය යුතු වේ.මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් සමාලෝචිත වර්ෂය වන විට එවැනි අනුමැතියක් නොමැතිව පශ්චාත් උපාධි පාඨමාලා 40 ක් පවත්වා ගෙන යනු ලබයි. | මෙම පාඨමාලාවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ආරම්භ වීමට ප්‍රථමව ආරම්භ කරන ලද පාඨමාලාවන් වේ. කෙසේ වුවත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශයේ විගණන නිර්දේශයට අනුව මෙවැනි පාඨමාලාවන් පිළිබඳ තොරතුරු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දැනුම් දීම සඳහා අදාළ කටයුතු සම්පාදනය කරමින් පවතී. | පවත්නා නීති, රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

3.4 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ඉන්දු ශ්‍රී ලංකා පදනම මඟින් පර්යේෂණ කටයුතු සඳහා 2017 වර්ෂයේදී ලැබී තිබූ රු.368,125 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් උපයෝජනය කර නොතිබුණි. | 2018 වසර තුළ දත්ත එකතු කිරීමේ මූලික ක්‍රියාවලිය පමණක් සිදු කළ හෙයින් 2018 වසර තුළදි කිසිදු වියදමක් දරා නොමැත. 2019 වසර තුළ එම පර්යේෂණයන්ට අදාළ වියදම් දැරීමට බලපොරොත්තු වේ. | අරමුදල් අරමුණු ලඟාකර ගැනීම සඳහා කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ආයතනය තුළ සංවර්ධන කටයුතු සඳහා 2017 හා 2018 වර්ෂවලදී Minan Buddhist College China මඟින් ප්‍රතිපාදනය කර තිබූ රු.4,565,701 ක මුදලක් 2019 මාර්තු 07 දින වන විටත් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. | චීනයේ මිනාන් බෞද්ධ අධ්‍යාපන ආයතනය (Minnan Buddhist College, China) මඟින් දෙවරකදී අදාළ මුදල් පරිත්‍යාග කරනු ලැබුයේ ආයතනයේ සංවර්ධන කටයුතු සඳහා යොදාගැනීමටය. කෙසේවුවත් ආයතනය විසින් මෙම මුදල් ශිෂ්‍ය නේවාසික ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා යොදා ගැනීමට තීර්ණය කළ අතර එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ මූලික වැඩ කටයුතු සකස් කරන තෙක් එම මුදල් ස්ථාවර ගිණුමක තැන්පත් කිරීමට තීරණය කර ඇත. | ආයතනික අරමුණු ඉටු කර ගැනීමට හැකි වන පරිදි අරමුදල් උපයෝජනය කළ යුතුය. |

3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනය වෙත 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදිත රු.4,000,000 ක මුදලින් රු.2,500,000 ක මුදලක් 2018 ඔක්තෝබර් 02 දින වන විට නිදහස් කර ඇතත්, සැලසුම් කර තිබූ තාවකාලික වාහන ගාල් කිරීමේ ස්ථානය, රියදුරු කාමරය, ගබඩා කාමරය හා වැසිකිලි පද්ධතිය යනාදිය ඉදිකිරීම 2018 දෙසැම්බර් අවසානය වන තෙක් ආරම්භ කර නොතිබුණි. | මෙම කටයුතු 2018 වර්ෂයේ මුල් භාගයේදී සිදු කිරීමට සැලසුම් කර තිබුණද ඒ හා සම්බන්ධ ඇස්තමේන්තු සැලසුම් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වැඩ ඒකකයෙන් 2018 ඔක්තෝම්බර් මසදී ආයතනය වෙත ලබා දුන් අතර 2018 වසර තුළ පුවත්පත් දැන්වීමක් මඟින් එයට අදාළ ප්‍රසම්පාදන කටයුතු 2018 වසර තුළදීම ආරම්භ කරන ලදී. | අරමුදල් ආයතනික අරමුණු ලඟාකර ගැනීම සඳහා කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ /2009 (I) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව, සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය මේ වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත. කෙසේ වුවද, විධිමත් නොවන පරිදි මේ දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයෙන් අවශ්‍ය විගණන කටයුතු සඳහා සේවය ලබාගත් අතර ඔවුන්ට ප්‍රමාණවත් මානව සම්පත ලබා නොදීම මත විධිමත් විගණන සැලැස්මක් මත DM/A/2009(i) කළමනාකරණ චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට නොහැකි වී ඇත. | 2019 අංක 18 දරන ජාතික විගණන පනතේ මඟපෙන්වීම් අනුවද කඩිනමින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිට විය යුතුය. |

4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමග සැසැඳීමේදී විෂයන් 13 ක සියයට 20 සිට සියයට 143 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | තත්‍ය ආදායම් හා වියදම් විවිධ සාධක මත රදා පවතින බැවින් එම කටයුතුවල ආදායම් හා වියදම් 100% ක් නිවැරදිව පුරෝකථනය කිරීම අපහසුය. අවධානම අඩු කිරීම සඳහා සාමාන්‍යයෙන් සිදු කරනුයේ තරමක අධි ඇස්තමේන්තුගත කිරීමකි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර, ඊට අනුගත විය යුතුය. |

4.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/IA දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" අනුව සමාලෝචිත වර්ෂයට අදාළව මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට / පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | ආයතනය විසින් දැනට සිදුකරගෙන යන සමහර පර්යේෂණ කටයුතු තිරසාර අරමුණු වලට අනුගත වන අතර තිරසාර අරමුණු ලඟා කරගැනීම සම්බන්ධව දැනට මෙම ආයතනය සවිස්තර සැලැස්මක් සකස්කර නොමැති අතර ඉදිරියේදී එවැනි සැලැස්මක් සකස් කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ මඟපෙන්වීම්වලට කඩිනමින් අනුගත විය යුතුය. |